Post/HQ/OP/IPS/D/WPD(SOUVENIR)/2026
ජාත්‍යන්තර තැපැල් සේවා අංශය
තැපැල් මූලස්ථානය,
කොළඹ 01000
2026.08. 28

සියලුම තැපැල් කාර්ය මණ්ඩල සාමාජික සාමාජිකාවන් වෙත,

**<u>2026 ලෝක තැපැල් දිනය - සමරු කලාපය සඳහා නිර්මාණ ඉදිරිපත් කිරීම</u>**

2026 වසරේ ලෝක තැපැල් දින තේමාව *"One postal network, infinite possibilities"* ලෙස නම් කර ඇත. එම තේමාවට අදාල වන සේ හෝ තැපෑලට අදාළ වෙනත් මාතෘකාවක් යටතේ වන ලිපි/නිර්මාණ ලෝක තැපැල් දින සමරු කලාපයට ඉදිරිපත් කිරීමට ඔබට අවස්ථාව ඇත.

නිර්මාණ වල පිටු සැකැස්ම:

- උපරිම ප්‍රමාණය - A4 ප්‍රමාණයේ පිටුවක එක් පැත්තක් (වචන 400 -450 අතර)
- පරිගණකයෙන් අකුරු මුද්‍රණය (MS Word මෘදු පිටපත අවශ්‍ය වේ)
- Font: Iskoola pota (Unicode font), Baamini, Times New Roman
- Font Size: 12
- පේළි දෙකක් අතර ඉඩ ප්‍රමාණය (Spacing) : 1.15
- භාෂාව: සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි
- සුදුසු පින්තූර යොදා ගත හැකි නමුත් පැහැදිලි ඡායාරූප විය යුතුය.

නිර්මාණ ඉදිරිපත් කල යුතු ආකාරය:

- නිර්මාණ තැපැල් දෙපාර්තමේන්තුවේ සේවය කරන අයෙකු විසින්ම සපයන ලද නිර්මාණයක් විය යුතුය.
- නිර්මාණය එවන්නාගේ නම, දුරකථන අංකය, රැකියා ස්ථානය, තනතුර ඇතුළත් විස්තර සහිත ලිපියක් ආසන්නතම මාණ්ඩලික නිලධාරියා විසින් සහතික කර නිර්මාණයේ මෘදු පිටපත 2026 ලෝක තැපැල් දින සමරු කලාප කමිටුවේ සභාපති, අධිකාරී (ජාත්‍යන්තර තැපැල් සේවා) වෙත **<u>supdt.ips@slpost.lk</u>** යන email ලිපිනයට ඉදිරිපත් කල යුතුය.
- දෘඩ පිටපත අධිකාරී (ජාත්‍යන්තර තැපැල් සේවා), ජාත්‍යන්තර තැපැල් සේවා අංශය, තැපැල්මූලස්ථානය, නො. 310 D. R. විජේවර්ධන මාවත, කොළඹ 01000. වෙත ලියාපදිංචි තැපෑලෙන් යොමුකල යුතු අතර, කවරයේ ඉහල කෙලවරවම්පස "ලෝක තැපැල් දින සමරු කලාපය" ලෙස සඳහන් කල යුතුය.
- සමරු කලාපයේ පිටු ප්‍රමාණයන් සීමිත බැවින් සමරු කලාපයට ඇතුලත් කිරීම කෙරෙන නිර්මාණ ලෝක තැපැල් දින සමරු කලාපයේ නිර්මාණ තේරීම සඳහා වන අනු කමිටුව විසින් තෝරා පලකෙරෙනු ලැබේ.
- **නිර්මාණ භාර ගන්නා අවසාන දිනය 2026 සැප්තැම්බර් මස 21 වේ.**

නිර්මාණාත්මක කුසලතාවයන් ඇති ඔබ සැමට ලිපි / නිර්මාණ ඉදිරිපත් කිරීම සඳහා ආරාධනා කරමි.

එස්.ආර්.ඩබ්.එම්.ආර්.පී. සත්කුමාර
තැපැල්පති

එස්. ආර්. ඩබ්. එම්. ආර්. පී. සත්කුමාර
තැපැල්පති